# රාජ්‍ය පරිපාලනය හා බුදු සසුන



ක්‍රි.ව. 1530 ට පෙර මහයා පාලනය

ක්‍රි.ව. 1530 - 1581 මායාදුන්නේ රජු (මොහු සිරි විජයබා නමින් ගණේගොඩ යාදින්නේ හැඳින්වේ...

ක්‍රි.ව. 1581 - 1592 ටිකිරි බණ්ඩාර (රාජසිංහ i)

ක්‍රි.ව. 1592 - 1595 එල්ලාවල රාජසූර්ය කුමරු

මායාදුන්න පුර සීතාවකම බවත් මහයා උපන්නේ ජයගත් ප්‍රදේශය බවත් මහයා-ගේ නියම්ගම මානියම්ගම වියහැකි බවත් කලින් පැහැදිලි කළෙමි. මහ පැරකුම් අවධියේ සිටම මානියම්ගම ප්‍රසිද්ධියට පත්ව තිබුණි. නම්පොතේ (විහාර අස්න) මානියම්ගම විහාරය සඳහන්ව තිබේ. ප්‍රධාන රජකෙනෙකු පෙර මේ ප්‍රදේශයේ සිට නැත මහයා (මහදිපාද) වරයකු යටතේ පවතින්නට ඇත. ක්‍රි.ව. 1529 දි කෝට්ටේ සත්වන විජයබාහු මරවා පුතුන් තිදෙනා බලය ලබා ගත්තේ රජ පදවියට හිමි අය සිටියදී වෙනත් අයකුට රජය පැවරීමට ගත් තීරණයක් නිසාය. භුවනෙකබාහු කෝට්ටේ රජවිය. රයිගම් බණ්ඩාර රයිගමත් මායාදුන්නේ කුමරු සීතාවකත් රජවූහ. මේ සිද්ධිය විජයබා කොල්ලය නමින් ප්‍රචලිතයි. මේ අවධියට පෙර මහනුවර හා යාපනයේත් උඩුගම්පල මාදම්පේ වැනි ස්ථාන වලත් ප්‍රදේශාධිපතීහු සිටියාහ. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව බිඳ වැටුණු යුගයකි. බෙදාගන පාලනය කිරීමේ දුර්වල අවිචාරවත් ක්‍රියා මාර්ගය නිසා අවාසනාවන්ත යුගයක් සේ සැලසිය හැකිය. භුවනෙකබාහුගෙන් පසු කෝට්ටේ රජකම හිමිවිය යුතුව තිබුණේ මහයා පදවිය ඉසිලූ මයාදුන්නටය. එහෙත් ඒ නීත්‍යානුකූල අයිතිය අමතක කර සිය මුණුබුරු ධර්මපාලට පැවරීමට ගිය බැවිනුත් ඔහු පෘතුගීසින්ගේ ගැත්තකු වී ඔවුන්ගේ මනාපය පරිදි කටයුතු කළ බැවිනුත් මයාදුන්නේ රයිගම්බණ්ඩාර සමඟ එක්වී කෝට්ටේ අවුල් ඇති කළේය. එනිසාම පෘතුගීසීන්ගේ උදව්ය ඇතිව භුවනෙකබාහු තෙවරක්ම සීතාවක රාජධානිය විනාශ කළේය. වයස එකොළහේ සිටම ටිකිරි බණ්ඩාර රාජසිංහ මෙම විනාශය නිස ඇතිවූ සාධාරණ කෝපය උඩ ලංකාවේ පෘතු-ගීසීන්ගේ ප්‍රධාන සතුරා බවට පත්විය. මේ අතර ධර්මපාල කෝට්ටේ රජ උනේ පරංගීන් අතර භුවනෙකබාහු මියගිය පසුය. (1551-1597) මොහුගේ රුවක් තනවා පෘතුගාලයට යවා එහි ජෝන් රජු ලවා එම රුවට ඔටුණු පලඳවා ලංකාවේ රජකම තහවුරු කර ගැනීමට ඔහු ගත් ක්‍රියා මාර්ගය ඉතාම දුර්වල අනුවණ කර්තව්‍යයකි. විදේශීය ජාතියකට රට පාවා දීමේ පරගැති කමකි.

රාජසිංහගේ රාජ්‍ය කාලය 1581 සිට 1592 දක්වාය. මයාදුන්නේ ජීවත්ව සිටියදීම මොහුට රාජ්‍ය කටයුතු හා යුධ මෙහෙයුම් කටයුතු පවරා තුබුණු බව පෙනේ. ටිකිරි බණ්ඩාර සතරකෝරළයේදී වීදිය බණ්ඩාර හා කළ සටනින් ජයගෙන පැමිණි පසු පියරජු පුතා කෙරෙහි අතිශයින් පැහැදුනේය. පිය පුතු දෙදෙනා අතර මත ගැටුමක් නොවූ බව රාජාවලිය අනුව පෙනේ.

"මායාදුන්නේ රජ්ජුරුවෝ තමාගේ ශ්‍රී රාජසිංහ කුමාරයන්ට තමාගේ ආඥා පනතට පවතිනා හැටියට පවතින්නජ මහා සේනාවටත් අවසර දුන්නාහ. එසේ අවසර ලැබගෙන කුමාරයා පියමග රජාණන් සිත් ලෙසට විසුවාහ."

"රාජාවලිය"

මේ රාජාවලි පාඨය අනුව රාජසිංහයන්ට මායාදුන්නේ රජු මැරීමට අවශ්‍යතාවක් නොවීය. ඔහු පියා මැරූ බයට රාජාවලිය නොකියයි. එහෙත් රාජසිංහයන් කෙරෙහි භක්තියත් ප්‍රසාදයත් ඇතිව ඔහුගේ සුරු විරු කම් මහ ඉහළින් අගය කරයි.රට වැසියන්ගේත් භික්ෂූන් වහන්සේගේත් අනුග්‍රහය මොහුට නොලැබුණේ ජාතියේ අවාසනාවටයි. එසේ සහයෝගය

"වයස අවුරුදු එකොළහේ සිට සටන් බිමේ සිටි මා ඉදිරියේ කිසිම රජෙක් නොවීය. එහෙත් දැන් උඩරටට පැමිණ ඇත්තේ පින්වත් අයෙකි. මගේ පිං මහිමය ගෙවී අවසානය." ජීවිතය අවසානයේ රජතුමා පරාජය ඉවසා ගන්නේ එසේය. රාජසිංහයන් ගේ අවසන් කටයුතු සිදුවූයේද සාමන්‍ය මිනිසෙකුට වත් සිදුනොකරන අන්දමේ පහළ මට්ටමකිනි. උඩරට අන්තිම සටනින් පැරද ආපසු එද්දී පෙතන්ගොඩ උයනේදී රජුට තුවාලයක් සිදුවිය. කරවනැල්ලට පැමිණෙන විට රජු කොර විය. (කොරවුන ඇල්ල) කරවනැල්ලට පැමිණෙන වූ බව කියනු ලැබේ. ආපසු හැරී අඟුලෙන් කැළණි ගඟ දිගේ පහළට ගොස් ගඟ දිගේ ඉහළට යමින් සිටියදී කිකිළි බිත්තර වැල්ලේදී මරණය සිදුවිය. මෘත දේහය ගඟේ සිට කැපූ ඇල මාර්ගය ඔස්සේ පාකර ගෙනවුත් වැලිවිටියේ තැම්පත් කළ බව සඳහන් වේ. රජුට විරුද්ධව පැවති කුමංත්‍රණ යේ අවසාන අවස්ථාව මෙය නොවිය හැකිද කටුවක් ඇනී සුළු වේලාවකින් කොර උනේත් ඊට මඳ වේලාවකින් මිය ගියේත් අවසන් කටයුතු අමුතුම අන්දමකින් වහාම නිම උනේත් කවර හේතූන් නිසාද?

ලැබුණානම් අපේ ඉතිහාසය මීට වඩා හිතකර වන්නට තිබුණි. රාජසිංහයන්ට විරුද්ධව විශාල කුමන්ත්‍රණයක් රටපුරා ක්‍රියාත්මක විය. එය මෙහෙයවා ඇත්තේ භාක්ෂූන් වහන්සේලා විසිනි. ටිකිරි බණ්ඩාරයන්ගේ සොහොයුරකු වූ තිඹිරිපල බණ්ඩාර රජකම පැවරීමට උන්වහන්සේලා කැමැත්ත පළ කළහ. ටිකිරි කුමරු භික්ෂූන් කෙරහි බිඳුනේ ඒ හේතුව මතය. ගණේගොඩ යාදින්න අනුව ටිකිරි කුමරු භික්ෂූන් වහන්සේ කෙරහි එරෙහි වූයේමවිකුස බිහිවන්නටත් පෙර යක්ෂ ආත්ම භාවයක සිටියදීය. රත්නාලංකාර හිමියන් පවා රජුගෙන් මැරුම් කෑ බවත් භික්ෂූන් වහන්සේලා හැට නමක් කණ මැදිරි (ගණ + මැඩිලි) වලට දැමූ බවත් තවත් අය හිටුවා පස් ගසා නඟුලෙන් සී සෑ බවත් ජන ප්‍රවාද වල එයි. මේ කිසිම තොරතුරක් රාජාවලියේ සඳහන් නොවීම විශේෂ දෙයකි. ටිකිරි බණ්ඩාර අතින් පියා මිය යාම අහම්බෙන් වූවක් හැටියටයි ජන ප්‍රවාදවල සඳහන් වන්නේ. කුමරු මේ නිසා සිත් තැවුලට පත්වීය. ඔහු සැනසීමට භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් වූයේ නැත. නායක භික්ෂූන් නිහඬව සිටියදී සාමනේර භික්ෂුවක් පිළිතුරු දුන් බව ගණේගොඩ යාදින්නේ සඳහන් වේ. භික්ෂූන් වහන්සේලා රජුවෙත කිසිම අයුරකින් සානුකම්පිත දෘෂ්ටියක් නොහෙළූ බව මේ හැම කරුණකින්ම හෙළිවේ. එනිසාම භික්ෂූන් වහන්සේ කෙරෙහි රජතුමාගේ සැකයද වර්ධනය විය. "මාපිටිගම (වැද්දාවල) බෝ රුප්පාවක් යටදී පිරිත් කියා ගණේගොඩ දෙවි බන්ධනයකට අසු කිරීමට සූදානම් වූ භික්ෂූන් රජු දකිත්ම බියෙන් ඇලලී අව සිහියෙන් දෙදෙනා බැගින් පැමිණ කණමැදිරි වලට පැන මිය ගිය බව ගැමියන් කරන ඇතැම් තොරතුරුවල ඇත. මෙතැන සිදු වූයේ රජු අල්වා මැරවීමට කළ කුමංත්‍රණයක් දැයි කල්පනා කළ හැකිය. ආඩිගුරුහු අවස්ථාවාදීව රජුට ලඟා වූහ. ශිව සමය වැළඳගෙන සිරි පදලසත් බිරාඬි දෙවොලත් ආඬිත්ට පවරන්නට හේතුව මෙයයි.

එතෙක් පැවති පාලන තන්ත්‍රයේ අසාර්ථකභාවය දුටු රටේ භෞමික අඛණ්ඩතාව රැක ගැනීමේ අවශ්‍යතාවය දුටු රටේ එක්සත්භාවය අගය කළ එමෙන්ම පෘතුගීසින් රටෙන් පළවා හැරීමේ මහඟු කාර්යය ජීවිතය පරදුවට තබා අවංකව කරට ගත්, කුමංත්‍රණ කරුවන්ට අවනත නොවූ අර්ථවත් කරුණ නයෙකයෙකු හැටියට රාජසිංහන් යන්තම් යථාර්ථයෙන් හඳුන්වා දී ඇත්තේ රාජාවලියේ පමණි.

තදබල බෞද්ධ විරෝධී හැඟීමක් රජුතුළ වූ බවක් සැවුල් සන්දේශය අනුවද නොපෙනේ. දෙල්ගමු විහාරය පිහිටියේ සීතාවකට එතරම් ඈතින් නොවේ. රාජසිංහයන්ගේ බල ප්‍රදේශය තුළමයි. මහින්දාලංකාර හිමියන් එහි සුරක්ෂිතව සිටි බව එම සංදේශය සාක්ෂි දරයි. සංදේශය රැගෙන යන්නේ තෙවළා දහම් කඳ සවණ බරණ කළ සමන් සුරිඳු වෙතයි. සංදේශය දෙවියන්ගෙන් අයදින්නේ මුනිසස්න ළතර රාජසිංහ නිරිඳු, මැතිගණ හා ඇතස් රිය පාබළ සෙන් රකින ලෙයසි. රජුගේ අබෞද්ධ පිළිවෙත චූල වංශයේ හුවා දක්වා ලියා ඇත්තේ අතිශයෝක්තියෙන් බව පෙනේ. හිරිපිටියේ රාළ දළදා වහන්සේ කෝට්ටෙන් සීතාවකට ගෙන යනු ලැබූ පෘතුගීසීන්ගෙන් උදව් ඇතිව සීතාවක ආක්‍රමණය කළ බැවින් ආරක්ෂක හේතු මත දෙල්ගමු විහාරයට ගෙනැ යන්නට ඇත.

කන්ද උඩරට සීතාවක යටතට ගැනීමට මායාදුන්නේටවත් රාජසිංහයන්ටවත් නොහැකි විය. එක් පැත්තකින් පෘතුගීසීන්ටත් තව අතකින් කන්ද උඩරට විරුද්ධවාදීන්ටත් විරුද්ධව දෙයාකාර සටනක් මෙහෙය වන්නට තරුණ රාජසිහට සිදුවිය. පෘතු-ගීසීන් ලංකාවෙන් පලවා හැරීමේ කාර්යය සපල කරගත නොහැකි වූයේ මේ හේතුවෙනි.

"වයස අවුරුදු එකොලහේ සිට සටන් බිමේ සිටි මා ඉදිරියේ කිසිම රජෙක් නොවීය. එහෙත් දැන් උඩරටට පැමිණ ඇත්තේ පින්වත් අයෙකි. මගේ පිං මහිමය ගෙවී අවසානය" රාජසිංහයන්ගේ අවසානයේ රජතුමාගේ පරාජය ඉවසාගන්නේ එසේය. රාජසිංහයන් ගේ අවසන් කටයුතු සිදුවූයේද සාමාන්‍ය මිනිසෙකුට වත් සිදු නොකරන අන්දමේ ප කන්ද උඩරට සීතාවක යටතට ගැනීමට මායාදුන්නේටවත් රාජසිංහයන්ටවත් නොහැකි විය. එක් පැත්තකින් පෘතුගීසින්ටත් තව අතකින් කන්ද උඩරට කුමන්ත්‍රණකාරී විරුද්ධවාදීන්ටත් විරුද්ධව දෙයාකාර සටනක් මෙහෙව වන්නට තරුණ රාජසිංහට සිදුවිය. පෘතුගීසීන් ලංකාවෙන් පළවා හැරීමේ කාර්යය සපල කරගත නොහැකි වූයේ මේ හේතුවෙනි.

"වයස අවුරුදු එකොළහේ සිට සටන් බිමේ සිටි මා ඉදිරියේ කිසිම රජෙක් නොවීය. එහෙත් දැන් උඩරටට පැමිණ ඇත්තේ පින්වත් අයෙකි. මගේ පිං මහිමය ගෙවී අවසානය." ජීවිතය අවසානයේ රජතුමා පරාජය ඉවසා ගන්නේ එසේය. රාජසිංහයන් ගේ අවසන් කටයුතු සිදුවූයේද සාමන්‍ය මිනිසෙකුට වත් සිදුනොකරන අන්දමේ පහළ මට්ටමකිනි. උඩරට අන්තිම සටනින් පැරද ආපසු එද්දී පෙතන්ගොඩ උයනේදී රජුට තුවාලයක් සිදුවිය. කරවනැල්ලට පැමිණෙන විට රජු කොර විය. (කොරවුන ඇල්ල) කරවනැල්ලට පැමිණෙන වූ බව කියනු ලැබේ. ආපසු හැරී අඟුලෙන් කැළණි ගඟ දිගේ පහළට ගොස් ගඟ දිගේ ඉහළට යමින් සිටියදී කිකිළි බිත්තර වැල්ලේදී මරණය සිදුවිය. මෘත දේහය ගඟේ සිට කැපූ ඇල මාර්ගය ඔස්සේ පාකර ගෙනවුත් වැලිවිටියේ තැම්පත් කළ බව සඳහන් වේ. රජුට විරුද්ධව පැවති කුමංත්‍රණ යේ අවසාන අවස්ථාව මෙය නොවිය හැකිද කටුවක් ඇනී සුළු වේලාවකින් කොර උනේත් ඊට මඳ වේලාවකින් මිය ගියේත් අවසන් කටයුතු අමුතුම අන්දමකින් වහාම නිම උනේත් කවර හේතූන් නිසාද?

රාජසිංහයන්ගෙන් පසු සීතාවක රජකම හිමිඋනේ එල්ලාවල සිටි රාජසූර්ය කුමාරයාටයි. ඔහුගේ රාජ්‍ය කාලය තෙවසරකි. අනතුරුව පැලෑද විසූ වේදය පතිරාජයන්ගේ බිසව පැමිණි නමුත් පෘතුගීසීන්ගේ බලය යටතේ ඇයද පරාජය වූවාය. අරිට්ට කී වෙණ්ඩු ගේ උපදෙස් ඇතිව නිකපිටියේ බණ්ඩාරද සුළුකලක් රාජ්‍ය කළ බවත් නිකපිටිය බණ්ඩාර ගේ සොයුරිය සමඟ විවාහ වීමට අරිට්ට කී වෙණ්ඩු කළ උත්සහය අසාර්ථක වූ බවත් සඳහන් වේ.

ඊට පසු පෘතුගීසීහු සීතාවකපුරය සම්පූර්ණයෙන් විනාශ කළහ. රජ මාලිගාව ගින්නෙන් දවාලූහ. තල්දූවේ හෙරණ්ඩි දෙවොලද විනාශ කළත් කළුගල් වලින් කළ ගොඩනැගිල්ලක් නිසා පහළ කොටස් පමණක් ඉතිරිවිය. ඉතිරිවී ඇති ටිකත් ආත්මාර්ථකාමී මිනිසුන් ගේ ක්‍රියා නිසා ක්‍රමයෙන් විසිරී යනු දක්නට ඇත. සීතාවක පුරාණය පිළිබඳ යථාර්ථය සම්පූර්ණයෙන්ම වැලලී ගොස් ඇත. ජාතියේ ආඩම්බරයට පහළ වූ එහෙත් ජාතියේ අවාසනාව නිසා අකාලයේ විනාශ වී ගිය එඩිතර තරුණ නායකයකු පීතෘ ඝාතකයකු, සංඝ ඝාතකයකු බෞද්ධ විරෝධියකු හැටියට හඳුන්වා දෙනු ලැබ නාම මාත්‍රය පමණක් ඉතිරි වී ඇත. කෘතඥතාව පෙරදැරි කරගත් සාමාන්‍ය සිංහල ජනතාව අදත් සිද්ධ ගණේගොඩ දෙවි හාමුදුරුවන් නමින් විරාභිමාන ටිකිරි බණ්ඩාර රාජසිංහයන්ගේ දේවත්වයෙන් පුදති.

"ශත වර්ෂ එක්දහස් පන්සිය දාහතරක් වූ මැදින් මස පුර පසළොස්වක තිටියලත් බුද්ධ දින, ශ්‍රී ලංකාද්වීපය එකසත් කළාවූ ටිකිරි බණ්ඩාර රාජසිංහ මහ රජ්ජුරුවෝ එම සීතාවක මාලිගයේදී ඉකුත්ව කෙලාශප්‍රාප්ත වූහ."

"අලකේස්වර යුද්ධය"

විචාරකයෝ විමසත්වා



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි